**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

**මහනුවර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 07 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2008 වර්ෂයේදී ප්‍රජා මූල සංවිධාන සඳහා ගෙවිය යුතු රු.128,950 ක් ප්‍රජා ජල ව්‍යාපෘති ගිණුමෙන් අඩු නොකට කලින් ලැබීම් යටතේ දක්වා තිබුණි.

(ආ) 2005 වර්ෂයේ අසාර්ථක වීම හේතවෙන් ගෙවීම් කිරීම අත්හරින ලද හන්තාන ගලහ ජල යෝජනා ක්‍රමයේ ජල ටැංකිය ඉදිකිරීමට ඇස්තමේන්තු කරන ලද රු.285,404 ක මුදල කර්මාන්ත ණයහිමියන් යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් කර්මාන්ත ණයහිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වේ.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන ඉඩම් හා ගොඩනැගිලි 67 ක් සහ එම ලේඛනයේ ඇතුලත් කර නොමැති ඉඩම් හා ගොඩනැගිලි 48 ක් තක්සේරු කර එහි වටිනාකම් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධන ගත කර නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සභාවට ලැබී තිබූ යතුරු පැදි 02 ක වටිනාකම තක්සේරු කර මෝටර් රථ හා කරත්ත ගිණුමට ගෙන නොතිබුණි.

(ඉ) 2003 වර්ෂයේ සිට 2008 දක්වා වර්ෂ 05 ක කර්මාන්ත ණයගැතියන් වශයෙන් පෙන්වා ඇති ව්‍යාපෘති 54 කට අදාල රු.3,092,401 ක මුදලක් ප්‍රතපූර්ණය කර ගැනිමට හෝ ගිණුම්වල ගැලපිමට හෝ කටයුතු කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 05 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 15,778,453 ක් වූ අතර, උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 16,368,842 ක් විය.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු. 8,282,031 ක් විය.

### 1.3.4 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගු ලාසි සංග්‍රහය</u> | |
| (i) 396 (ඇ) | මාස 06 ක් ඉක්මවූ රු.5,791 ක් වටිනා චෙක්පත් 11 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි |
| (ii) 485 (4) | සේවා ස්ථානයෙන් මාරුවී ගිය නිලධාරින්ගේ ණය ශේෂ අදාල ආයතනවලින් ගෙන්වා ගත යුතු නමුත්, 2008 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එනු ලබන එකතුව රු.83,634 ක්වූ ණය ශේෂ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 04 ඡේදය | මියගිය නිලධාරින්ගෙන්/සේවකයින්ගෙන් අය විය යුතු ණය මුදල්, ඔවුන්ගේ මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අය කළ යුතු වුවත්, 2008 වර්ෂයේ සිට රු.18,790 ක් වටිනා ණය ශේෂ 02 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) චක්‍රලේඛ 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PP/437 දරණ රාජ්‍ය මුදල් | සියළුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන තම ආයතන අවශ්‍යතාවයන් අනුව සාමාන්‍ය රක්ෂණ ආවරණ ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයෙන් පමණක් සලසා ගත යුතු වුවද, ඊට පටහැනිව සභාවේ වාහන 02 ක් 2010 වර්ෂය වෙනුවෙන් රක්ෂණය කර පුද්ගලික රක්ෂණ සමාගමකට රු.78,609 ක් ගෙවීම් කර තිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,259,546 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,580,665 ක් විය.

2.2. ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 2,662 | 2,484 | 178 | 2,772 | 1,173 | 3,927 |
| (ii) බදු කුලී | 3,324 | 2,562 | 762 | 1,022 | 530 | 1,709 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,667 | 1,148 | 519 | 1,116 | 1,100 | 15 |
| (iv) වෙනත් ආදායම් | 18,778 | 22,071 | (3,293) | 12,642 | 14,883 | 11,884 |

2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 460,658 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්ර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු. 12,747,875 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 පරිසර බලපත්‍ර ගාස්තු

-------------------------

2010 වර්ෂයේ පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ස්ථාන 22 කින් රු. 169,400 ක ආදායමක් ලබාගෙන නොතිබුණි.

2.2.5 කඩ කුලි

---------

ගිවිසුම් ප්‍රකාරව බදු කුලි අයකර ගැනිමට කටයුතු නොකිරිම හේතුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලිය රු.2,231,725 ක් විය.

2.2.6 ජල ගාස්තු

-------------

ගිවිසුම් ප්‍රකාරව ජල ගාස්තු අයකර ගැනිමට කටයුතු නොකිරිම හේතුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට ජල ගාස්තු හිඟය රු.4,619,929 ක් ව පැවතුණි.

2.2.7 වරිපනම් හා අක්කර බදු

---------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 4,864,484 ක් වූ හිඟහිටි වරිපනම් හා අක්කර බදු 1987 අංක15 දරන ප්‍රාදේශය සභා පනතේ අංක 158 (1) හා 159 (1) වගන්තිවල විධි විධාන අනුව අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.3 වියදම් ව්‍යාහය

---------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පෞද්ගලික පඩිනඩි | 22,816 | 21,170 | 1,646 | 22,299 | 19,965 | 2,334 |
| අනෙකුත් | 9,299 | 5,571 | 3,728 | 8,835 | 5,261 | 3,574 |
| උප එකතුව | 32,115 | 26,741 | 5,374 | 31,134 | 25,226 | 5,908 |
| ප්‍රාග්ධන වියදම | 36,834 | 29,813 | 7,021 | 34,145 | 14,521 | 19,624 |
| මුළු එකතුව | 68,949 | 56,554 | 12,395 | 65,279 | 39,747 | 25,532 |

2.4 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 03 | 02 |
| ද්විතීයික | 30 | 22 |
| ප්‍රාථමික | 48 | 38 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 23 |

2.5. වත්කම් කළමනාකරණය

---------------------------

2.5.1 ලැබිය යුතු ගිණුම්

-------------------

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 27,685,135 ක් වු අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 4,571,345 ක් විය.

2.5.2 අයවීමට ඇති සේවක ණය

----------------------------

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.3,000,147 ක්වු අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂ වල එකතුව රු. 21,990 ක් විය.

2.6 හඳුනාගත් පාඩු හා හානි

---------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී සහ සභාව පවත්වා තිබූ තොරතුරු අනුව රු. 143,672 ක අගයකට වූ පාඩු හා හානි අනාවරණය වී ඇත.

(අ) සභාව සතු පුස්තකාලවලට අදාලව 2009 වර්ෂයේ සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණවලදී වටිනාකම රු.139,026 ක්වු පුස්තකාල පොත් 1104 ක ඌනතාවයක් හෙළිදරව් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර එකී අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවා නියුක්ති භාර අරමුදලට නියමිත දිනට පෙර දායක මුදල් නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදි රු.892 ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ඇ) සේවක අර්ථ සාධක අරමුදලට මාසික ගෙවීම් ප්‍රමාදවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි රු.3,754 ක අධිභාරයක් ගෙවා තිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) සභාවේ පවත්වාගෙන යනු ලබන ණයහිමි ලේඛනය හා අනෙකුත් ලියවිලි අනුව 2006 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා රු.4,435,285 ක මුදලක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල් වෙත නොගෙවා ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) 2003,2004 සහ 2005 වර්ෂවලදී කර්මාන්ත ණයහිමියන් යටතේ වෙන් කරන ලද රු.437,696 ක්වූ අතරැදවුම් මුදල් පියවීමට හෝ රජයේ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) වටිනාකම රු. 6,130 ක්වූ 2003 වර්ෂයේ සිට ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ ඉදරියට එන පරිසර ඉල්ලුම් පතු සඳහා වූ ඇප මුදල ආපසු ගෙවීමට හෝ රජයේ ආදායමට ගැනීමට හෝ කටයුතු නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය
------------------------

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) තොග පාලනය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය
(ඊ) සේවක ණය පාලනය.